

ඡායාරූප ශෙල් මුණිදාස

# සන්නස

**Sannasa**
244 Princes Hwy
Hallam VIC 3803 Australia

email -
sannasanews@gmail.com
Tel 0432 391 922/ 0433 438 535
www.sannasa.net
www.sannasa.com

**සංස්කරණය / Editors**
ජගත් ජේ එදිරිසිංහ
Jagath J Edirisinghe
අසෝක සුබසිංහ
Asoka Subasinghe

**සහය සංස්කාරක /Asst Editor**
**ක්‍රීඩා සංස්කාරක / Sports Editor**
අසෝක සිල්වා Asoka Silva

**රූ රටා / Graphics**
අතුල උපසිරි කල්දෙමුල්ල
Athula Upasiri Kaldemulla

**සේයා රූ/ Photography**
ප්‍රසන්න නාමල් කුරුකුලරත්න
Prasanna N Kurukularathne
විජිත කුමාර
Wijitha Kumara

**වෙළඳ දැන්වීම් / Advrertising**
S Jayasinghe
03 8707 4604 / 0402 025 516
email- sjturaus@optusnet.com.au

Kuma Gamage
0414 215 230
email- ads.sannasa@gmail.com

**Account Name - Sannasa Media**
Bank - Westpac
BSB Number - 033 341
Account Number - 590847

**සන්නස පිරිවර**
සිසිර දිසානායක
ලක්ෂ්මන් කොඩිතුවක්කු
වි ක ධර්මබන්ධු
මහින්ද දිසානායක දිවුල්ගනේ

**සම්බන්ධීකරණය**

NSW
Lakshman Kodituwakku
Athula Upasiri Kaldemulla

QLD
Ananda Samarathunga
2 Santorini Place
Forrest Lake QLD 4078
07 3372 7958

ACT
Asoka Nimalasiri
0400 429 031

WA
Ven Beruwala Sobhitha Thero
Sri Lanka Perth Budhist Vihara

වැදගත්

සන්නස පුවත්පතේ පළවන ලිපිවල අන්තර්ගතය ඒ ඒ ලේඛකයා / ලේඛිකාව ගේ අදහස් වන අතර ඒවායින් සංස්කා රකවරුන්ගේ අදහස් පිළිබිඹු නොවන බව සළකන්න
සන්නස පුවත්පතින් උපුටාගත් බව සඳහන් කරමින් ඒවා උපුටා දැක්වීමට අවසර ඇත

## ලියා දන්වන වග

ශ්‍රී ලංකාව තුළ ඉතා සෙමින් නමුත් තිරසාර අන්දමන් වඩාත් සාධනීය දේ සිදුවෙමින් පවතින බව මැදහත්ව බලා සිටින විට පෙනී යයි. ශ්‍රී ලංකාව කළාපය තුළ පමණක් නොව ලෝකය තුළම වඩාත් ගෞරවාන්විත ස්ථානයක් අත්පත් කරගනිමින් සීටීම ඉදිරි ගමන උදෙසා වැදගත්ම සාධකයක් බවට පත්ව තිබෙයි. පසුගිය දින කීපයේ සිදු වූ වඩාත් සාධණීය කරුණු කාරණා අතර එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කොමසාරිස් සෙයිද් අල් හුසේන් කුමරුගේ ලංකා ගමන ඉතාම වැදගත් ය.

ශ්‍රී ලංකා රජයේ ආරාධනයෙන් කෙරුණ හුසේන් කුමරුගේ සංචාරයෙන් ලංකාව පිළිබඳ වඩාත් පැහැදිලි චිත්‍රයක් ලෝකය හමුවේ විවර කෙරුණ බව ඔහුගෙන් ලද ප්‍රතිචාර පෙන්නුම් කරයි. ලෝකයට චණ්ඩි පාට් දමමින් ප්‍රශ්න වලින් මග ඇර සිටින්නට මුග්ධ උත්සාහ දරනු වෙනුවෙට සැබෑ ප්‍රශ්නයට බුද්ධිමත් ලෙස මුහුණ දීමේ වැදගත්කම මේ සංචාරයෙන් තව තවත් තහවුරු වූ බව නිසැකය.

ශ්‍රී ලංකාව වැනි කුඩා රාජ්‍යයක පැවැත්ම ඇත්තේ ලෝකය සමග පවත්වාගනු ලබන සුහදතාව හා සංහිඳියාව මතය. ඒ කාරණයේදී කළාපීය බලවතා වන ඉන්දියාව සමගද සහසම්බන්ධතා පවත්වා ගත යුතු වෙයි. මේ කාරණය වත්මන් පාලකයන් තේරුම් ගෙන සිටීම සතුටට කරුණකි. බෙදී වෙන්ව ගිය දුර්වල ශ්‍රී ලංකාවක් දැකීම ඉන්දියාවේ අභිප්‍රාය නොවේ. එවන් තත්වයක් ඉන්දියාව කෙරෙහිද නරක බලපෑමක් ඇතිකරවන බව ඔවුහු දනිති. එනිසාම ලංකාවේ ඒකීය භාවය ඉන්දියාවට වැදගත්ය. හුසේන් කුමරුගේ ලංකා සංචාරය තුළින් මතුව එන සුබවාදී අනාගතයක පෙ-රනිමිති දැකීම ඉන්දියාවේ ද සතුටට හේතු වනු ඇති බව නිසැකය.

සියල්ල අසුබවාදී ලෙස පෙන්වාදෙන්නට උත්සාහ දරනා පරාජිත හොර නඩය පසුපස අන්ධව දුවන්නන් හැරුනුකොට රටේ බහුතරය වන අන් සියල්ලෝම මේ තත්ත්වය මැනැවින් වටහාගෙන සිටීම සතුටකි.



# මැතිවරණ ක්‍රමය වෙනස් කළ යුතුද ?

## රෝහණ හෙට්ටිආරච්චි



### ශ්‍රීලාල් සෙනෙවිරත්න



**ශ්‍රී ලංකාවේ මැතිවරණ ක්‍රමය වෙනස් කළ යුතු බවට සංවාදයක් ආරම්භවන්නේ දශකයකට පමණ පෙරාතුවය. එහෙත් එම වෙනස කර ගැනීම සඳහා ව්‍යවස්ථාදායකය හෝ රට පාලනය කළ ආණ්ඩු මෙතෙක් සමත් වී නොමැත. මේ වන විට නැවත වරක් ව්‍යවස්ථා සංශෝධනය සහ මැතිවරණ ක්‍රමයේ සංශෝධනයන් පිළිබඳව සාකච්ඡා අරඹා තිබේ. ලංකාවේ මැතිවරණ ක්‍රමය වෙනස් කළ යුතුද? වෙනස් කල යුතු නම් එහිදී අවධානය යොමුකළ යුතු අංශ කවරේද යන්න පිළිබඳ නිදහස් සහ සාදාරණ මැතිවරණ සඳහා වන ජනතා ක්‍රියාකාරිත්වයේ විධායක අධ්‍යක්ෂ රෝහණ හෙට්ටිආරච්චි මෙසේ අදහස් දක්වයි.**

ශ්‍රී ලංකාවේ මැතිවරණ ක්‍රමය වෙනස් කළ යුතු බවට මතු කරන තර්ක අතර ප්‍රධාන කරුණු කිහිපයකි.

1 පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් ජනතාවට වග නොකියන බව
2 මනාප ක්‍රමය නිසා ගැටුම් ඇති කරන බව
3 මැතිවරණයකදී සැබෑ ජනමතය මුදලින් යට කරන බව
4 සුදුස්සන් මැතිවරණයට ඉදිරිපත් නොවන බව
5 කාන්තා නියෝජනයට ප්‍රමාණවත් ඉඩක් නොමැතිකම

මැතිවරණය ක්‍රමය වෙනස් කළ යුතු බවට නැගෙන ප්‍රධානම තර්කයක් වනුයේ පවත්නා ක්‍රමය තුළ කොට්ඨාශයට ජනතාවට වගකියන්මන්ත්‍රීවරයෙක් නොමැති කමය. පවතින ක්‍රමය තුළ දේශපාලන පක්ෂ ඉදිරිපත් කරන ලැයිස්තුව හරහා තේරිපත් වන මහජන නියෝජිතයන් මුළු දිස්ත්‍රික්කයේම මහජනතාවට වගකිව යුතු වූවද, එහි පවත්නා විසිරුනුභාවයත් එමෙන්ම ඔහුට හෝ ඇයට මුළු දිස්ත්‍රික්කයෙන්ම ඡන්ද ලබාගත හැකිවීම නිසා පහසුවෙන්ම වගකී-මෙන් නිදහස්වීමට මන්ත්‍රීවරයාට හැකිවී තිබේ. එමෙන්ම මෙම ක්‍රමය තුළ සමහර කොට්ඨාශයට කිසිදු මන්ත්‍රීවරයෙකු නොමැති වීමත්

12 වන පිටට